# 18. පරීක්ෂාවන් ජය ගනිමු

ශු. ලූක් 4 : 1-13

කිතුනු දරුවකු ඉරුදින දේව නමස්කාරයට යන්නට සූදානම් වෙමින් සිටිය දී දුරකථන ඇමතුමක් ලැබුණි. ඒ ඔහුගේ මිතුරකුගෙන් ලද ආරාධනයකි. එදින විනෝද ගමනකට සහභාගි වී ප්‍රීති ප්‍රමෝද වීමට ඉතා ම ආකර්ෂණීය ඇරයුමකි. දැන් ඔහු ඉදිරියේ තිබුණේ ප්‍රබල පරීක්ෂාවකි. ඔහුට එකවර මතක් වූයේ පාසලේ දී ඉගෙන ගත් පාඩම ය. ජේසුස් වහන්සේ පරීක්ෂා ඉදිරියෙහි දේව වචනය අනුව ක්‍රියා කළ ආකාරය තදින් ම හිතට කා වැදී එකවර ම තීරණය කළේ ඉරුදින කළ යුතු යහපත කරන්නට ය.

අපගේ ජීවිත කාලය තුළ දී මුහුණ දෙන පරීක්ෂා, ඉදිරිපත් කරන්නේ සුන්දර යෝජනා ය. එවැනි අවස්ථා ඔබට මතක් වෙනවා ඇත. ක්‍රීඩා පිටියේ දී පාසලේ වාර විභාගවල දී පරීක්ෂා මගින් පෙළඹවීම් ඇති වේ. යොවුන් වියේ පසුවන ඔබ මුහුණ දෙන පරීක්ෂාවන් වෙනස් බව වැටහෙනවා ඇත. අනාගතයේ රැකියාවේ යෙදෙන අවස්ථාවේ ද විවිධ පරීක්ෂාවන්ට මුහුණ දීමට සිදු වේ. ජීවිතයේ කුමන අවධියක වුව ද පරීක්ෂා විවිධ ස්වරූපවලින් අප හමුවට එන බව ද දත යුතු වේ. ඒවා ඉදිරියෙහි යහපත් ලෙස ක්‍රියා කිරීමට උත්සහා දරන අවස්ථාවල දී සාතන් යෝජනා කරන්නේ පහසු මාර්ගය තෝරා ගැනීමට ය. එවැනි අයහපත් මගකට යොමු වීමේ දී අපි පරීක්ෂා ඉදිරියෙහි පරාජිත වෙමු.

ජේසුස් වහන්සේ ජෝර්දාන් ගංගාවෙහි බෞතිස්මය ලබා ශුද්ධාත්මයෙන් පූර්ණ ව පාළුකරයට පිවිස දින සතළිහක් තුළ නිරාහාර ව සේවයට සූදානම් විය. ඒ බව ශුභාරංචි පොත්වල වාර්තාවේ. ජනතාව උදෙසා යහපත් සේවයක් දියත් කිරීමට එළඹ සිටි අවස්ථාවේ, ඒ සඳහා පහසු මාර්ගය යක්ෂයා විසින් යෝජනා කෙරුණි.

**ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා**
**ශු. ලූක් 4 : 1-13**

## පළමු පරීක්ෂාව ශු. ලූක් 4:3

නිරාහාර ව පාළුකරයේ ගත කළ කාලය තුළ මනුෂ්‍යයකු වූ ජේසුස් වහන්සේට බඩගිනි ඇති විය. යක්ෂයා එම අවස්ථාව යොදවා ගත්තේ ආහාර සැපයීම මගින් ජනතාව දිනා ගැනීමට ය. කාන්තාර ප්‍රදේශයක් වූ එම පරිසරයේ සුළංවලින් මට්ටම් වූ සුදු පැහැති රවුම් ගල් තිබුණි. ඒවා පාන් බවට පරිවර්තනය කර ජනතාවගේ ශාරීරික පෝෂණය සඳහා යොදා ගැනීමට යෝජනා කිරීම සූක්ෂම පරීක්ෂාවකි. මින් ජේසුස් වහන්සේගේ දේව පුත්‍ර භාවයට අභියෝගයක් ද ඉදිරිපත් කෙරිණි. මෙහිදී උන්වහන්සේට පොර බැදීමට සිදු වූයේ තම සුව පහසුව සහ ජනතාවගේ ශාරීරික පෝෂණය සඳහා පමණක් දේව බලය යොදා ගැනීම ද නැතහොත් ඔවුන්ගේ ආත්මික පෝෂණය උදෙසා වැය වීම ද යන්න ය. ශුද්ධ ලියවිලි මැනවින් දැන සිටි ජේසුස් වහන්සේ එම පරීක්ෂාව ජය ගැනීමට ශුද්ධ ලියවිලි උපයෝගී කර ගත් සේක. .

## පිළිතුර

"මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව, දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියළු වචන වලින් ය." යන ද්විතීය නීති සංග්‍රහයේ 8:3 පදය මගින් යක්ෂයාට ප්‍රතිචාර දක්වා අභියෝග ජය ගත් සේක. මිනිස් දිවි මග තුල හුදෙක් ශාරීරික පෝෂණය පමණක් නොව. ආත්මික පෝෂණය අත්‍යවශ්‍ය බව මෙයින් අනාවරණය කළ සේක.

**දේව රාජ්‍යයේ පුරවැසියන් තම ශාරීරික පෝෂණය උදෙසා කටයුතු කරන අතර ඊටත් වඩා ආත්මික පෝෂණය ලබා ගැනීමට දිරි දැරිය යුතු වේ.**

ශු. ලූක් 4:6-7 අනුව යක්ෂයා උන්වහන්සේ උස් තැනකට පමුණුවා ඉදිරිපත් කළ පරීක්ෂාවකි. "මේවා කෙරෙහි මුළු ආධිපත්‍යය ද ඒවායේ යස ඉසුරු ද ඔබට දෙන්නෙමි. ඒවා මට පවරා දී ඇති හෙයින් මා කැමති කෙනෙකුට ඒවා දෙමි. එබැවින් ඔබ මා ඉදිරියෙහි නමස්කාර කරන්නෙහි නම් ඒ සියල්ල ඔබ සන්තක වන්නේ යයි කීය.

## දෙවන පරීක්ෂාව ශු. ලූක් 4:5-7

මෙම පරීක්ෂාවෙන් යක්ෂයාට හිමි ලෝකයේ, රාජ්‍යයන්, බලය, යස ඉසුරු ජේසුස් වහන්සේට දීමට කොන්දේසිය වූයේ යක්ෂයාට නමස්කාර කිරීම ය. ඒ මගින් නපුරේ බලවේගයන්ට කීකරු වී ලෞකික රාජ්‍යයක් පිහිටුවා ගැනීමට ඉදිරිපත් කළ අභියෝගයකි.

එහෙත් ජේසුස් වහන්සේ මිහිපිට වැඩියේ ලෞකික රාජ්‍යයක් පිහිටුවීමට නොව, දේව රාජ්‍යය ගොඩනැගීමට ය. දේව ආධිපත්‍යය ස්ථාපිත කිරීමට ය. දේව රාජ්‍යයේ වටිනාකම් ඔස්සේ දෙවියන් වහන්සේට ගරුබිය ඇති ජනතාවක් ගොඩ නැංවීමට ය.

## පිළිතුර

ජේසුස් වහන්සේ දේව වචනය මගින් පිළිතුරු දෙමින් "නුඹේ දෙවි වන ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කරන්න. උන්වහන්සේට පමණක් සේවය කරන්න" යනුවෙන් කී සේක. ද්විතීය නීති සංග්‍රහයේ 6:13 පදයේ මෙය සඳහන් වේ.

**ධනය, බලය, කීර්තිය, ලෞකිකත්වය වැනි දැයට මුල් තැන දෙන සමාජයක වෙසෙන කිතුනු අපට ජේසුස් වහන්සේ දුන් පිළිතුර පැහැදිලි ය. එනම් දෙවියන් වහන්සේට සියළුම කටයුතුවල දී මුල් තැන දිය යුතු බව ය. උන්වහන්සේට දේව ගරුබිය පාමින් ජීවත් විය යුතු බව ය. දේව රාජ්‍යයේ ගුණධර්ම අනුව දෙවිවූ ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කිරීමට කීකරු ව බැහැපත් වීම ය.**

## තෙවන පරීක්ෂාව ශු. ලූක් 4:9-11

මෙම තෙවන පරීක්ෂාව මගින් ජේසුස් වහන්සේ මුහුණ දුන්නේ ආශ්චර්යයක් මගින් ජනතාව දිනා ගැනීමේ අභියෝගයකට ය. එනම් දේව මාලිගයේ කොත මුදුනින් පැන වීර ක්‍රියාවක් කිරීමට ය. මේ සඳහා යක්ෂයා ජේසුස් වහන්සේ පෙළඹවීමට ශුද්ධ ලියවිලි පාඨයක් යොදා ගත්තේය. "ඔබ ගන්නා සෑම පියවරක දී ඔබ රක්නා පිණිස

එතුමාණෝ සිය දූතයන්ට අණ දෙන සේක" ගීතාවලිය 91:11-12 පදය. "ඔබ දෙපා ගල්වල නොහැප්පෙන පිණිස ඔවුහු සියතින් ඔබ උසුලා ගන්නෝ ය" යන්න ය. යක්ෂයා පරීක්ෂා ඉදිරිපත් කිරීමේ දී ශුද්ධ ලියවිලි ද උපකරණයක් කරගත් බව මෙයින් පැහැදිලි වේ. සමහර අවස්ථාවල දී අප ද මෙවන් අදහස් මගින් පරීක්ෂාවන්ට ගොදුරු විය හැකි ය. යක්ෂයා සැකයේ බීජයක් ජනිත කරන්නට මෙම පාඨය යොදා ගත්තේ ය. ජේසුස් වහන්සේ කුරුසි පත් වූ අවස්ථාවේ ද මෙවැනි අභියෝගයක් ඉදිරිපත් විය

## පිළිතුර

ජේසුස් වහන්සේ එම පරීක්ෂා ප්‍රතික්ෂේප කරමින් දුන් පිළිතුර වූයේ"නුඹේ දෙවි වන ස්වාමින්වහන්සේ පරීක්ෂා නොකරන්න". ද්විතීය කථාව සංග්‍රහයේ 6:16 අනුව දෙවියන් වහන්සේ කෙරෙහි පමණක් පූර්ණ විශ්වාසය තබමින් ජේසුස් වහන්සේ මෙම තෙවන පරීක්ෂාව ද ජයගත් බව පෙනී යයි. කුරුසිපත්ව සිටි අවස්ථාවේ දී පවා ජේසුස් වහන්සේ මෙවැනි පරීක්ෂාවක් මගින් ආශ්චර්යයක් කිරීමට අභියෝගයක් එල්ල විය. උන්වහන්සේ සමග කුරුසිපත්ව සිටි වරදකරුවෙක් මෙසේ අභියෝග කළේ ය.(ශු. ලූක් 23:39) ඔබ ක්‍රිස්තුස් නොවේ ද? ඔබවත් ගලවා ගෙන අපත් ගලවා ගන්න" කීමෙනි.

පරීක්ෂා ඉදිරියේ ජේසුස් වහන්සේ නිර්භීත ව ශුද්ධ ලියවිලි උපයෝගී කරගෙන යක්ෂයාගේ යෝජනා ප්‍රතික්ෂේප කළ සේක. ජේසුස් වහන්සේ දේව කැමැත්තට අවනත වී කුරුසියේ මාර්ගය තෝරා ගත් සේක.

### සිතා බලමු

**ජේසුස් වහන්සේ වැඩියේ දේව රාජ්‍යය ගොඩ නැංවීමට ය. එහෙත් යක්ෂයාගේ අභිමතය වූයේ ලෞකික රාජ්‍යය මිහිපිට ස්ථාපිත කිරීමට ජේසුස් වහන්සේ පොළඹවා ගැනීමට ය. නපුරු බලවේග අභිබවා ජය ගැනීමට උන්වහන්සේගේ ප්‍රතිචාරය බලවත් ය.**

**අප ජීවිත ගමනේ දී විවිධ අවස්ථාවල පරීක්ෂාවලට මුහුණ දීමට සිදු වේ. කිතුනු අනුගාමික අප ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම සෙවිය යුතු වේ. දේව වචනය නිසි ලෙස අවබෝධ කරගෙන ඒවා තුළ දේව මගපෙන්වීම සොයා ගැනීමට උත්සාහ කළ යුතු වේ. දේව රාජ්‍යයේ දරුවකු ලෙස පරීක්ෂා ඉදිරියේ දේව කැමැත්තට යටත් වීමට ඉගෙන ගත යුතු වේ.**

ක්‍රියාකාරකම

1. ජේසුස් වහන්සේ පරීක්ෂා ජය ගත්තා සේ ඔබට ද පරීක්ෂාවලට මුහුණ දීමට සිදුවන අවස්ථාවන්හි දී ඉන් ජය ගැනීමට පෝෂණය ලබා ගත හැකි මාර්ග 3ක් ලියා දක්වන්න.

2 දස පනතෙහි සඳහන් ආඥාවක් දෙවන පරීක්ෂාව හා සංසන්දනය කරන්න.